## පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2017

-----------------------------------------------

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි අංක 5678 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි 11 වගන්තියේ ඇ(3) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය හා වැවිලි මානව සංවර්ධන භාරය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම අනුව, රු.මිලියන 7,250 කට සමාන එජඩො මිලියන 50 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2021 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) පසුගිය වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් ගැටළු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණ බව සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
---------------

### 2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදලේ උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | 2017 දෙසැම්බර් 31 දිනට |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජා.සං.සං. | 50 | 7,250 | 750 | 522.86 | 638.83 |
| | 50 | 7,250 | 750 | 522.86 | 638.83 |

ව්‍යාපෘතියේ මෙහෙයුම් අත්පොත අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,450 කට සමාන ඇමෙරිකන් ඩොලර් මිලියන 10 ක් වියදම් කිරීමට ලේඛණගත කර තිබුණි. කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 750 ක් පමණක් වෙන් කර තිබුණි. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සහ රේඛීය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමට අනුව රු.මිලියන 523 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ලැබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් තෝරා ගෙන තිබුණ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1,500 කට පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රු.300,000 බැගින් මූල්‍ය සහායක් ලබා දී තිබුණි. එසේ වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1,375 කට අත්තිකාරම් වශයෙන් රු.මිලියන 202.69 ක් නිදහස් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 20 ක පමණක් පහසුකම් සංවර්ධනය කර තිබුණි. තවද, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන් 2,200 ක් සඳහා පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන්වලින් 2017 දෙසැම්බර් 31 දින වන විට ගුරුවරුන් 284 ක් පමණක් පුහුණු කර තිබුණි.

(ආ) ඊට අමතරව, සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට ලේඛනගත කල සිසුන් 7000 ක් සඳහා පෙර පාසල් ගාස්තු සහන වැඩසටහන, ගුරුවරුන් 1800 සඳහා කාලීන අන්තර් ක්‍රියා වැඩසටහන, දෙමව්පියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 300 ක් ආදිය 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අරමුදල් යැවීමේ ක්‍රමවේදයේ ඇති ප්‍රමාදය නිසා වැඩසටහන් යටතේ ඇති ක්‍රියාකාරකම් ආරම්භ කල නොහැකි බව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෙනිවැල්ල, සපුමල්කන්ද, පනාවත්ත, දේවාලේකන්ද සහ අන්හෙට්ටිගම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ඉදිකිරීම් වැඩ අදාල පිරිවිතර අනුව කර නොතිබුණ බව 2017 දෙසැම්බර් කෑගල්ල කලාපයේ සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය. එහිදී නඩත්තු සඳහා තත්වයෙන් අඩු සනීපාරක්ෂක සවිකිරීම් සහ දැව භාවිතාකර තිබුණබව නිරීක්ෂණය විය.

(ආ) රු.මිලියන 1.69 ක පිරිවැයට මිලදී ගන්නා ලද සෙල්ලම් බඩු උපකරණ, ලීබඩු සහ මුලුතැන්ගෙයි උපකරණ කෑගල්ල, නුවරඑළිය සහ රත්නපුර කලාපවල පිහිටා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 06 ක ඉදිකිරීම් කටයුතු නිම වීමට පෙර වතු සමාගම්වල කළමණාකරනය වෙත බෙදා හැර තිබුණි. එම ලීබඩුවල ආරක්ෂාව පිළිබඳ සැලකීමකින් තොරව වතු පරිශ්‍රයේ අක්‍රියව පවතින බව විගණනයේ දී තවදුරටත් නිරීක්ෂණය විය.

**3.4 මූල්‍ය පාලනයේ ගැටලු**

**-----------------------**

සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙර 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතු වුවත්, 2017 මාර්තු එය පිළියෙල කර තිබුණි.